**ජාතික ලොතරැයි මණ්ඩලය - 2021**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් 2003 වර්ෂයේ දී හඳුන්වා දී තිබූ මධ්‍යගත Sage ACCPAC නැමැති පරිගණක මෘදුකාංගය මගින් මණ්ඩලයේ ගිණුම් කටයුතු සිදු කර තිබුණි. 2016 වර්ෂයේ දී එම පද්ධතිය විමධ්‍යගත කිරීම නිසා එම මෘදුකාංගයෙන් ලබාගත හැකි සේවාවන් සීමිත වී තිබුණි. කලින් පැවති මධ්‍යගත ක්‍රමය මගින් ආයතනයේ ගනුදෙනු පිළිබඳව පැවති විශ්වාසනීයත්වය ද මෙම විමධ්‍යගත ක්‍රමය යටතේ ප්‍රශ්නගත වී තිබුණු අතර, වරින්වර අදාළ වෙනස් කිරීම් නිසා ඇති වන අවදානම්වල වගකීම භාර ගැනීම මෙම මෘදුකාංගය හඳුන්වා දුන් සමාගම ද ප්‍රතික්ෂේප කර තිබුණි. | මධ්‍යගත Sage Accpac පරිගණක මෘදුකාංගය භාවිත කිරීමේ දී සිදු වූ ණයහිමි පාලක ගිණුමේ ශේෂයක් දැනටමත් ප්‍රධාන ජර්නලයේ ඉතිරි වී ඇත. මෙවැනි ගනුදෙනු සිදුවීම් ඉදිරියේදී වළක්වා ගැනීම සඳහා Accpac පද්ධතියට අලුතින් එකතු කරන ලද Accpac මොඩියුලයන් ප්‍රධාන ජර්නලයෙන් ඉවත් කර වෙන් වෙන් වශයෙන් පද්ධති දෙකක් ලෙස දැනට භාවිතා කරයි. නව සැලැස්ම තුළ පද්ධතියේ ඇති ඇතැම් අභ්‍යන්තර පාලන ගුණාංගයන් ඉවත්වීම හේතුවෙන් ඇතැම් පහසුකම් අක්‍රීය වී ඇති හෙයින් ඇතිවූ ප්‍රායෝගික ගැටළුකාරි තත්ත්වයන් මගහරවා ඒ සඳහා විශේෂිත පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමෙන් පසුව නැවත මධ්‍යගත පද්ධතියට සම්බන්ධ කිරීමට කටයුතු කරමින් පවතී. | පරිගණක මෘදුකාංග පද්ධතියෙන් හා පරිගණක ආරක්ෂණ පද්ධතියෙන් විශ්වාසනීය ලෙස අරමුණුගත කාර්යයන් ඉටු වන අයුරින් යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 අගෝස්තු 03 දිනැති අංක PE/LO/NLB/Gen/2016 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2016 වර්ෂයේ ජාතික ලොතරැයි මණ්ඩලයේ රඳවාගත් ඉපැයුම්වලින් රු.මිලියන 600 ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලෙස දැනුම් දී තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් 2016 වර්ෂයේදී අවස්ථා 02 කදී එකතුව රු.මිලියන 550 ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර තිබුණි. 2021 වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 550 ක් මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලයේ ගොඩනැගිලි සංචිත අරමුදල වෙත ලැබිය යුතු මුදලක් ලෙස සඳහන් කර තිබුණි. එසේ වුවද, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ජාතික ලොතරැයි මණ්ඩලය වෙත එවැනි ගෙවිය යුතු ශේෂයක් නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2022 මැයි 25 දිනැති අංක PED/S/NLB/3/3(ii) දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ සඳහන් පරිදි එසේ ලබා ගෙන ඇති මුදල් ඒකාබද්ධ අරමුදලට බැර වී ඇති බැවින් එම මුදල් නැවත ආපසු ලබා දීම සාමාන්‍යයෙන් සිදු නොකරන බව සඳහන් කර තිබුණි. ඒ අනුව ලැබිය යුතු ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මුදල් ඇමතිතුමා සහ අගමැතිතුමා සමඟ සිදු කරන ලද සාකච්ඡා මත පදනම්ව, 2016 වර්ෂයේදී රු.මිලියන 550 ක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇත. එවකට සිටි සභාපතිතුමිය විසින් 2016 සැප්තැම්බර් 19 දින භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත ලිපියක් යවා ඇති අතර භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් මෙම මුදල් නැවත ලබාදීමට එකඟ වූ බව එකී ලිපියේ දක්වා ඇත. මේ බව සඳහන් කරමින් 2022 ජුනි 08 දින මුදල් අමාත්‍යාංශයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් ද යොමු කර ඇත. | එම මුදල ආපසු ගෙවීම සිදු නොකරන බව දන්වා ඇති හෙයින් අදාළ පරිදි ගිණුම්වල ගැලපීම් කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුළ වෙළඳ හා | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී පාරිතෝෂික සඳහා ගෙවූ මුදල් වටිනාකම ලෙස වර්ෂයට අදාළ මුළු වියදම | මූල්‍ය ප්‍රකාශන වඩාත් නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අනෙකුත් ගෙවිය යුතු ශේෂයේ වෙනස්වීම සහ ගෙවන ලද පාරිතෝෂික දීමනා වටිනාකම රු.2,184,950 කින් වැඩියෙන් දක්වා තිබුණි. | සටහන් කර ඇත. මෙම ගෙවිය යුතු පාරිතෝෂික මුදල වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු ශේෂවල වෙනස්වීම සමඟ ගැලපිය යුතුය. නමුත් මෙම වරදින් මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහයෙහි වටිනාකම වෙනස් වී නොමැති අතර, ඉදිරි ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදිව සටහන් කිරීමට හැකි බව දන්වා සිටිමි. | |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට අවලංගු කළ චෙක්පත් ගිණුමේ ශේෂය රු.14,500,033 ක් විය. එකී ශේෂය තුළ 2019 වර්ෂයේ සිට විවිධ සැපයුම්කරුවන් හා ණයහිමියන් වෙත නිකුත් කළ චෙක්පත් 56 ක් මඟින් සිදු කළ ගෙවීම් ඇතුළත් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවලංගු කළ චෙක්පත් ගිණුමේ ඇතුළත් ගනුදෙනු පරීක්ෂා කර අදාළ ගිණුම්වල ගැලපීම් කර අවලංගු කළ චෙක්පත් ගිණුමේ ශේෂය නිරවුල් කර නොතිබුණි. 2020 වර්ෂයේ සිට පැවත එන බාහිර ආයතන දෙකකට ගෙවිය යුතු එකතුව රු.11,241,250 ක් වූ උපචිත වියදම සම්බන්ධයෙන් එම ආයතන නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබුණත්, ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මාස 06 ඉක්මවූ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් අවලංගු කර එම වටිනාකම තාවකාලික ලෙජර් ගිණුමක් වන අවලංගු චෙක්පත් ගිණුමට මාරු කරනු ලබන අතර, එය මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වගකීම් යටතේ වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ තුළ සටහන් කර ඇත. එම චෙක්පත් තවත් මාස 06 ක් ඇතුළත ඉල්ලුම් කළ හොත් අවලංගු කළ චෙක්පත් ගිණුම හරහා නැවත නිකුත් කරනු ලබන අතර එසේ ඉල්ලුම් නොකළ හොත් එම චෙක්පත් මණ්ඩලීය ආදායමට ගලපනු ලබයි. නීතිමය ගැටළුවක් මත නිදහස් නොකරන ලද පෞද්ගලික ආයතන දෙකකට ගෙවිය යුතු පිළිවෙලින් රු.3,910,000 ක් හා රු.7,331,250 ක් වශයෙන් එකතුව රු.11,241,250 කට අදාල චෙක්පත් 2020 වර්ෂයේ සිට මෙම ගිණුමේ පවතින අතර ඉදිරියේ දී මෙම ශේෂ උපචිත වියදම් ගිණුමට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුමේ ශේෂය පරීක්ෂා කර අදාළ ගිණුම්වල ගැලපීම් කළ යුතු අතර, මේ සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් විසින් නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබේ නම් ඒ බව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතු වීම. |
| (ඇ) | මණ්ඩලය විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන මහජන සම්පත ජනාභිශේකය ස්වර්ණ ජයන්තිය ගිණුම වෙනුවෙන් පිළියෙල කරන ලද 2021 දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම් ප්‍රකාශය | මෙම බැංකු ගිණුම මහජන සම්පත 4000 සහ මහජන සම්පත ජනාභිශේකය ස්වර්ණ ජයන්තිය මුදල් පොත් (B700) සඳහා විවෘත කර ඇති අතර, පසුව මෙම ගිණුම රජ දිනුම හා රන් කිරුළ සඳහා භාවිත කළ | බැංකු සැසඳුම් ප්‍රකාශයේ සඳහන් හඳුනා නොගත් ශේෂ හඳුනා ගෙන විධිමත්ව නිරවුල් කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| අනුව, මුදල් පොතෙහි ඇතුළත් නොවූ බැංකු ගිණුමට හර වූ සහ බැර වූ ශේෂ පිළිවෙලින් රු.72,260,545 ක් හා රු.76,970,786 ක් විය. 2010 වර්ෂයේ සිට පැවත එන එම ශේෂ හඳුනා ගෙන නිරවුල් කිරීමට 2022 ජූනි 15 දින වන විටත් මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | අතර ඉන් පසුව එම මුදල් පොත් නිරවුල් කර අදාළ ගිණුම් වෙත මාරු කිරීමට පෙර (B690) මුදල් පොත නැවතත් ගොවිසෙත විශේෂ දිනුම් වාර අංක 0003 සඳහා භාවිත කිරීමට සිදු විය. ගොවිසෙත විශේෂ දිනුම් වාර මුදල් පොතෙහි නිරවුල් කිරීම් අවසන් කර එහි මුදල් අදාළ ගිණුම් වෙත මාරු කිරීම ජූනි මාසය අවසානයේ සිදු කිරීමට කටයුතු කරමින් පවතී. එම නිරවුල් කිරීම් අවසන් කිරීමෙන් පසුව රජ දිනුම හා රන් කිරුළ යන මුදල් පොත් නිරවුල් කිරීම සිදු කරනු ලැබේ. එමගින් මෙම බැංකු ගිණුමේ සඳහන් කර ඇති හර හා බැර ශේෂයන් නිරවුල් වේ. | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 ඔක්තෝබර් 12 දින දිනුම් අදින ලද ජයවිරු සම්පත ලොතරැයිය වෙනුවෙන් රු.1,000,000 ක් වූ ත්‍යාග මුදල හා 2019 අගෝස්තු 24 දින දිනුම් අදින ලද මහජන සම්පත ලොතරැයිය වෙනුවෙන් වූ ජයග්‍රාහී මෝටර් රථය සඳහා ගෙවිය යුතු රු.3,350,000 ක් ලෙස එකතුව රු.4,350,000 ක වටිනා ජයග්‍රාහී ලොතරැයිපත් දෙකක ගෙවීම් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබුණි. එම ශේෂය තවදුරටත් ගෙවිය යුතු ත්‍යාග ශේෂ තුළ ඇතුළත් කර තිබුණි. | මෙම ත්‍යාග ගෙවීම් සම්බන්ධව පොලිස් විමර්ශන හා අධිකරණ ක්‍රියාමාර්ග පවතින බැවින් අදාළ ත්‍යාග ලබාදීම තාවකාලිකව අත්හිටුවා ඇත. | අප්‍රමාදව නිරවුල් කිරීමට කටයුතු කළයුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) වගන්තිය හා 1997 අංක 35 දරන මුදල් (සංශෝධන) පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනතේ 17(2) වගන්තිය | ලොතරැයි ආදායමෙන් පනතේ නිශ්චිතව දක්වා ඇති වියදම් අඩු කළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රඳවාගත් ලාභවල එකතුව රු.1,529,921 ක් ලෙස ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් තොරව, 2021 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය තුළ රඳවා ගෙන තිබුණි. | රඳවාගත් ලාභය ඒකාබද්ධ අරමුදලට බැර කළ හොත් ආයතනය තුළ එදිනෙදා කටයුතු කරගෙන යාමේ දී විශාල මූල්‍යමය අර්බුදයකට මුහුණ පෑමට සිදුවිය හැක. එබැවින් එම සම්පූර්ණ රඳවා ගත් ලාභය රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට හැකියාවක් නොමැත. මේ සම්බන්ධයෙන් 2021 නොවැම්බර් 16 දිනැති ලිපිය මඟින් මුදල් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. එමෙන්ම 2021 වර්ෂයේ දී විශේෂ බදු (Special Levy) ලෙස රු.මිලියන 900 මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇත. | අදාළ පනතේ විධිවිධාන අනුගමනය කළ යුතු වීම. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | රජයේ නීතිගත සංස්ථාවක කිසිම මුදලක් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මිස ආයෝජනය කරනු නොලැබිය යුතු වුව ද, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 5,071 ක් හා රු.මිලියන 1,353 ක් පිළිවෙලින් ස්ථාවර තැන්පතුවල හා කාලීන තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | මෙම ආයෝජන කටයුතු ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ හා සභාපතිගේ අනුමැතියෙන් සිදු කරනු ලබන අතර නිතර නිතර සිදු කරන මෙම කෙටිකාලීන ආයෝජන කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම කිසිසේත්ම ප්‍රායෝගික නැත. එමෙන්ම, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | අදාළ පනතේ විධිවිධාන අනුගමනය කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | විසින් මෑතක දි නිකුත් කරන ලද Operational Manual for State Owned Enterprises හි දක්වා ඇත්තේ රුපියල් බිලියන 30 ක අවම පිරිවැටුමක් ඇති ආයතන සඳහා ආයෝජන කමිටුවක් තිබිය යුතු බවත් ය. ඒ අනුව අපගේ ආයතනය එලෙස කමිටුවක් පත් කිරීම ද අවශ්‍ය නොවේ. කෙසේ නමුත්, මෑතක දී ගන්නා ලද තීරණයක් මත විශේෂ ආයෝජන පවතී නම් පමණක් ඒ සඳහා ආයෝජන කමිටුවක් පත් කර තීරණ ගැනීම සිදු කරයි. | |
| (ඇ) | මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ.371(2) | මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ දී මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත අවස්ථා 09 කදී එකතුව රු.622,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණු අතර, එම අග්‍රිමවලින් රු.139,000 ක් පියවීම සඳහා මාස 03 ක සිට මාස 08 ක් දක්වා පරාසයක කාල පමාවක් සිදු කර තිබුණි. | මෙම අත්තිකාරම් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රට වසා තිබූ කාල පරිච්ඡේදයේ සේවකයන් ප්‍රවාහනය සඳහා ඉන්ධන ලබා ගැනීමට භාවිතා කරන ලද අත්තිකාරම් වේ. මෙම අත්තිකාරම් ලබා දීම මේ වන විට නවතා ඇති අතර ඉදිරියේ දී හදිසි අවස්ථාවක දී සිදු කිරීමට සිදු වුවහොත් මෙම මුදල නොඉක්මවන ලෙසට කටයුතු කරන ලෙස අදාළ අංශ දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | මු.රෙ. 371(5) සහ මු.රෙ. 371(6) | මාණ්ඩලික නිලධාරීන් වෙත නිකුත් කර තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිමවලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අවස්ථා 11 කට අදාළ එකතුව රු.802,479 ක්වූ | මෙම අතුරු අග්‍රිම මුදල් මේ වන විට නිරවුල් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | අග්‍රිම නිරවුල් කර නොතිබුණු අතර, 2022 වර්ෂයේ දී ඒවා නිරවුල් කරන අවස්ථාව වන විට දින 20 ක සිට දින 780 ක් දක්වා පරාසයක කාල පමාවක් සිදු කර තිබුණි. | | |
| | (iii) මු.රෙ. 571 | සමාලෝචිත වර්ෂය අවසාන වන විට තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක කාලයක් ඉක්මවූ එකතුව රු.7,766,325 ක කල් ඉකුත් වූ ටෙන්ඩර් තැන්පතු නිරවුල් කිරීමට හෝ මණ්ඩලයේ ආදායමට හෝ ගෙන නොතිබුණි. | මෙම ටෙන්ඩර් තැන්පතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15(2) හා (3) ඡේද | මණ්ඩලය විසින් 1998 වර්ෂයේ දී අසරණ සරණ නමින් අරමුදලක් ආරම්භ කර එම අරමුදලට ලොතරැයි ත්‍යාගලාභීන්ගේ පරිත්‍යාග හා ලොතරැයි අලෙවි ආදායමෙන් සියයට 0.005 ක ප්‍රමාණයක ලැබීම් බැර කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට අරමුදලේ ශේෂය රු.24,030,981 ක් වී තිබුණි. එලෙස විශේෂිත අරමුදලක් පවත්වාගෙන යාම සඳහා චක්‍රලේඛ විධිවිධාන පරිදි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. ඒ අනුව ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු මුදල් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් මණ්ඩලය වෙත රඳවාගෙන තිබුණි. | නීරෝගා ලොතරැයියෙන් හා ලොතරැයි ත්‍යාගලාභීන්ගේ පරිත්‍යාගවලින් මෙම අරමුදල සමන්විත වී ඇති අතර, වර්තමානයේ දී අරමුදල සඳහා ත්‍යාගලාභීන්ගේ දායකත්වයක් නොමැත. 2020 සැප්තැම්බර් 09 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති PED/P/2/25(i) චක්‍රලේඛය පදනම් කර ගනිමින් ලබා දී ඇති 3832-17 අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත වර්ෂයට රු.මිලියන 2 ක මුදලක් වාර්ෂිකව අසරණ සරණ අරමුදල මඟින් ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා වෙන් කරනු ලබයි. ඒ අනුව 2022 වර්ෂය සඳහා මේ වන විටත් ලැබෙන ඉල්ලීම් සැලකිල්ලට | චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගෙන අවශ්‍යතාවය තහවුරු කිරීමෙන් පසු මූල්‍යමය දායකත්වය ලබා දීමට කටයුතු කරනු ලබයි. | |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්ය මණ්ඩලය සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණු අතර, එලෙස එක් එක් ලොතරැයිවල අලෙවි ආදායම් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂයේ දී දිරි දීමනා ලෙස එකතුව රු.110,344,291 ක් ගෙවා තිබුණි. | 2003 ජුනි 02 දිනැති PED/12 දරන චක්‍රලේඛයෙන් දිරිදීමනා මුදල් ගෙවීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතුව තිබූ බැවින්, මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් ජනාධිපති ලේකම් විසින් දිරිදීමනා ගෙවීම සඳහා අනුමැතිය ලබා දී ඇත. 2012 ජුනි 12 දිනැතිව NLB/AD/EX2012 අංක දරන ලිපියෙන් දිරි දීමනා ගණනය කිරීමේ ප්‍රතිශතය ඉහළ දැමීම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සඳහා ඉල්ලීමක් කර ඇත. 2019 ජනවාරි 25 වන දින PE/TR/DLB/Gen/2018 අංක දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් එවකට පවත්වාගෙන ගිය 0.5% දිරි දීමනා මුදල් ගණනය කිරීමේ සීමාවේම පවත්වාගෙන යාමට පමණක් අනුමැතිය ලබා දී ඇති අතර ඉදිරියේ දී රාජ්‍ය ව්‍යාපාරයන්හි දිරි දීමනා ගෙවීමට පොදු ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන පරිදි අනුමැතිය ලබා ගත යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 1993 ජනවාරි 21 දිනැති අංක PE1/70/7/Vo11 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය | රජය වෙනුවෙන් පවත්වනු ලබන සියලු ලොතරැයි ආදායමෙන් සියයට 16.5 ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය පවත්වා තිබු ලොතරැයි 11 කින් නියමිත ප්‍රතිශතයට වඩා අඩුවෙන්, එනම් සියයට 10 ක වටිනාකමක් පමණක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කිරීම නිසා තවදුරටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වටිනාකම රු.681,851,572 ක් වී තිබුණි. | මණ්ඩලය විසින් පවත්නා ප්‍රතිශතයන් අනුව ලොතරැයිපත්වලට අදාළ දායකත්ව මුදල නිවැරදිව ඒකාබද්ධ අරමුදලට බැර කර ඇත. මෙම ප්‍රතිශතයන් සම්බන්ධයෙන් පොදු අනුමැතියක් ඉල්ලා මුදල් අමාත්‍යාංශය වෙත අවස්ථා කිහිපයකදී ලිපි යොමු කර ඇති අතර මේ දක්වා එම ලිපි සඳහා පිළිතුරු ලැබී නොමැත. | චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,003,355,136 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,434,824,231 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.431,469,095 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වරින් වර රට වසා තැබීම නිසා ලොතරැයි අලෙවිය නතර වීම හා ඉන් පසුව ලොතරැයි අලෙවිය අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

මණ්ඩලයේ 2021 හා 2020 වර්ෂයන්ට අදාළ ලොතරැයිපත් ආදායම හා ප්‍රචාරණ වියදම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විස්තරය | 2021 | 2020 | වෙනස | වෙනස ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| **ආදායම** | | | | |
| ලොතරැයි අලෙවි ආදායම | 17,292,066,088 | 18,041,145,000 | (749,078,920) | 4.15 |
| විකුණුම් පිරිවැය | 14,396,877,247 | 14,923,669,223 | (526,791,976) | 3.53 |
| විකුණුම්, අලෙවිකරණ සහ බෙදාහැරීමේ වියදම් | 1,074,102,918 | 893,002,443 | 181,100,475 | .2028 |

(i) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ලොතරැයි අලෙවි ආදායම රු.749,078,920 කින් හා විකුණුම් පිරිවැය රු.526,791,976 කින් අඩු වී තිබුණු අතර, එය ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 4.15 ක් හා සියයට 3.53 ක් වී තිබුණි.

(ii) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී මණ්ඩලයේ ලොතරැයි අලෙවි ආදායම සියයට 4.15 කින් අඩුවී තිබුණද, විකුණුම්, අලෙවිකරණ සහ බෙදාහැරීමේ වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 20.28 කින් වැඩිවී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ ලාභදායීත්ව හා කාරක ප්‍රාග්ධන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| **අනුපාතය** | | **වර්ෂය** | |
|---|---|---|---|
| | | **2021** | **2020** |
| (i) | දළ ලාභ අනුපාතය | **14.38** | 14.89 |
| (ii) | ශුද්ධ ලාභ අනුපාතය | **5.55** | 6 |
| (iii) | ජංගම අනුපාතය | **3.1:1** | 2.97:**1** |
| (iv) | ක්ෂණික අනුපාතය | **3.09:1** | 2.95:**1** |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය සතු වොක්ෂෝල් වීදියේ පිහිටි ඉඩමේ ව්‍යාපාරික පරිශ්‍රය ඉදිකිරීම වෙනුවෙන් කෙරීගෙන යන වැඩ (Work – in Progress) ලෙස මණ්ඩලය විසින් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා උපදේශාත්මක සේවා ලබා ගැනීම වෙනුවෙන් රු.27,009,822 ක් වියදම් කර තිබුණි. | ජාතික ලොතරැයි මණ්ඩලයේ නව යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා උපදේශන සේවා ලබා ගැනීම වෙනුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය මත ගිවිසුම් ප්‍රකාරව මෙම වියදම දරා ඇත. | ඉදි කිරීම කඩිනම් කළ යුතු වීම. |
| (ආ) | ජාතික ලොතරැයි මණ්ඩලය කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලෙහි කුලී එකඟතා ගිවිසුමෙහි 08(6) ඡේදය ප්‍රකාරව දුරකථන, ජල හා විදුලි ගාස්තු වෙනුවෙන් මාස තුනක අමතර ආරක්ෂිත | මණ්ඩලය හා ගොඩනැගිලි හිමිකරු අතර ඇති කර ගත් ගිවිසුම සඳහා ආරක්ෂක තැන්පතුවක් ලෙස මාස 03 ක කුළී මුදල වන රු.24,357,375 ක් ගිවිසුම් ප්‍රකාරව ගොඩනැගිලි | මණ්ඩලයට වාසිදායක වන අයුරින් ගිවිසුම්ගත විය යුතු වීම. |

| | | |
|---|---|---|
| තැන්පතුවක් ලෙස රු.24,357,375 ක් ගෙවා තිබුණි. ගිවිසුමේ 08(9) ඡේදය ප්‍රකාරව ලබා දුන් මූලික තැන්පතුවෙන් වර්ෂ දෙක අවසන් වන විට රු.63,329,175 ක් ඉතිරි වන බව පූර්ව අවබෝධයක් සහිතව, අනාර්ථිකව ආයතනය විසින් ගොඩනැගිල්ලේ හිමිකරු වෙත රු.24,357,375 ක් අමතරව ගෙවා තිබුණි. | හිමිකරු වෙත ලබා දී ඇත. තවද තැන්පතුවක් ලෙස මාස 12 ක කුළී මුදල වන රු.63,329,175 ක් ගොඩනැඟිලි හිමිකරු වෙත ලබාදී ඇත. 2019 ජනවාරි මාසයේ සිට 2020 අගෝස්තු මාසය දක්වා ගිවිසුම් ප්‍රකාරව තැන්පත් මුදලෙන් මාසිකව සියයට 35 ක් බැගින් මාසික කුළියෙන් අඩු කර ගෙන ගෙවීම් කර ඇත. එසේ අඩු කර ගත් පසු ඉතිරිවූ මුදල සහ ආරක්ෂක තැන්පතුව මේ වන විට ගොඩනැඟිලි හිමිකරු භාරයේ පවතී. | |

## 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, එක් ලොතරැයිපතක් ඇමරිකානු ඩොලර් 10 කට විකිණීම සඳහා 2016 වර්ෂයේ දී මුද්‍රණය කරන ලද ඩොලර් ෆෝචූන් ලොතරැයිපත් 30,000 ක් අතරින් ලොතරැයිපත් 569 ක් අස්ථානගත වී තිබුණි. මෙම අස්ථානගත වූ ලොතරැයිපත්වල 2021 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.1,594,906 ක් වූ අතර, එම අස්ථානගත වීම පිළිබඳව විධිමත් පරීක්ෂණ සිදු කර වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන එම අලාභයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම එම ලොතරැයිපත් දිනුම් ඇදීම 2022 අප්‍රේල් 30 දින වන විටත් සිදු කර නොතිබුණි. | මෙම ලොතරැයි දිනුම් ඇදීමට අදාළව අස්ථානගත වූ ලොතරැයිපත් පිළිබඳව සොයා බැලීම සඳහා කමිටුවක් පත් කළ අතර, එම කමිටුව විසින් මුළු ලොතරැයිපත් 30,000 ක් පරීක්ෂාවට ලක් කරන ලදී. එහි දී ලොතරැයිපත් 786 ක් පමණක් අස්ථාන ගත වී ඇති අතර, ඒ පිළිබඳ තොරතුරු සොයා ගැනීමට නොහැකි වී ඇත. සත්‍යාපනය කර ගැනීමට නොහැකිවූ ලොතරැයිපත් මිලදී ගත් පුද්ගලයින් කවුරුන් ද යන්න පරීක්ෂා කර ගැනීම සඳහා කාණ්ඩ අංක සඳහන් කර භාෂා ත්‍රිත්වයෙන් පුවත්පත් දැන්වීමක් පල කරන ලදී. එයින් තොරතුරු ලබා ගැනීමට අපොහොසත් වන ලොතරැයිපත් ප්‍රමාණය තීරණය කර එකී ලොතරැයිපත් | විධිමත් පරීක්ෂණයක් සිදු කර සිදුවී ඇති අලාභය හා එයට වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගැනීමට හා අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | සම්බන්ධයෙන් පොලිස් පැමිණිල්ලක් යොමු කර දිනුම් ඇදීමේ කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. | |
| (ආ) 2021 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා අනුව මණ්ඩලයේ විවිධ අංශ 03 කට අයත් එකතුව රු.3,418,665 ක් වටිනා භාණ්ඩ හඳුනාගෙන නොතිබුණි. අංශ 11 කට අයත් එකතුව රු.1,473,327 ක් වටිනා භාණ්ඩ හානියට පත්ව තිබුණි. | මෙහි සඳහන් භාණ්ඩ සමීක්ෂණයේ දී ඉදිරිපත් කර නොතිබූ භාණ්ඩ සම්බන්ධයෙන් නැවත සොයා බලන ලදී. අස්ථානගත ලෙස සඳහන් ස්ථාවර වත්කම්හි 2021 දෙසැම්බර් 31 දිනට පොත් අගය රු.310,693 කි. මෙම අයිතම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ක්‍රියාකිරීමට කටයුතු කරනු ලැබේ. | හඳුනා නොගත් හා හානියට පත් භාණ්ඩ පිළිබඳව විධිමත් පරීක්ෂාවක් සිදු කළ යුතු වීම. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දින වන විට ලොතරැයි අලෙවි නියෝජිතයින්ගෙන් රු.103,190,357 ක් අය විය යුතුව තිබුණි. එම නියෝජිතයින් විසින් ඒ සඳහා ඇපකරයන් තැබිය යුතු වුව ද, එකතුව රු.20,400,906 ක ණයගැති වටිනාකම සඳහා පමණක් එලෙස ඇපකර තබා තිබුණි. ලොතරැයි ණයගැති ශේෂයෙන් සියයට 80 ක් හෙවත් එකතුව රු.82,789,451 ක ණය ශේෂය සඳහා එසේ බැංකු ඇපකර ලබා ගෙන නොතිබුණි. | මුල් කාලයේ සියලු දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින්ගෙන් බැංකු ඇපකර ලබා ගෙන නොමැති අතර වර්තමානයේ නව අලෙවි නියෝජිත පත්වීම් ලබාදීමේ දී බැංකු ඇපකරයක් ලබා ගැනීම සිදු කරනු ලබයි. පැරණි දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින්ගෙන් ද හැකිතාක් බැංකු ඇපකර ගැනීමට කටයුතු කරනු ලබයි. | ලොතරැයි අලෙවි නියෝජිතයින්ගෙන් විධිමත් ක්‍රමවේදයක් අනුව ඇපකර ලබා ගත යුතු වීම. |
| (ආ) 2021 දෙසැම්බර් 31 දින වන විට දින 365 ක් ඉක්ම වූ ණයගැති වටිනාකම රු.29,271,401 ක් වූ අතර එම අයවිය යුතු මුදල් අයකර ගැනීමට හෝ ඉන් බැංකු | දිනුම් අදින ලොතරැයිපත් සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විට දින 365 ඉක්ම වූ ණයගැති වටිනාකම රු.13,334,463 කි. 2021 දෙසැම්බර් 31 දින වන විට | ක්‍රමවත් අය කර ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ඇපකර සහිත ණය ගැතියන්ගේ වටිනාකම වූ රු.2,299,197 ක බැංකු ඇපකර මුදල් කර ගැනීමට හෝ මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | දින 365 ඉක්ම වූ ක්ෂණික ණය වටිනාකම රු.15,936,737 කි. ඉන් බැංකු ඇපකර සහිත ණයගැති වටිනාකම රු.126,015 ක් වන අතර රු.9,887,694 ක් වටිනා ණයගැති වටිනාකම අය කර ගැනීම සඳහා නීතිමය පියවර ගනු ලැබේ. | |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලයේ ලියාපදිංචි අලෙවි නියෝජිතයින් අතරින්, අලෙවි නියෝජිතයින් 64 දෙනෙකුට ක්ෂණික ලොතරැයිපත් ද, අලෙවි නියෝජිතයින් 79 දෙනෙකුට පැසිව් ලොතරැයිපත්ද ණය පදනම මත ලබා දී තිබුණු අතර ඉන් ක්ෂණික ලොතරැයිපත් වෙනුවෙන් අලෙවි නියෝජිතයින් 10 දෙනෙකු හා පැසිව් ලොතරැයිපත් වෙනුවෙන් අලෙවි නියෝජිතයින් 25 දෙනෙකු පමණක් බැංකු ඇපකර ලබා දී තිබුණි. ඒ අනුව ක්ෂණික ලොතරැයිපත් වෙනුවෙන් අලෙවි නියෝජිතයන් 54 දෙනෙකුගෙන් හා පැසිව් ලොතරැයිපත් වෙනුවෙන් අලෙවි නියෝජතයින් 54 දෙනෙකුගෙන් බැංකු ඇපකර ලබා ගෙන නොතිබුණි. | මුල් කාලයේ සියලු දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින්ගෙන් බැංකු ඇපකර ලබා ගෙන නොමැති අතර වර්තමානයේ නව අලෙවි නියෝජිත පත්වීම් ලබා දීමේදී බැංකු ඇපකරයක් ලබාගැනීම සිදු කරනු ලබයි. පැරණි දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින්ගෙන් ද හැකිතාක් බැංකු ඇපකර ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. | සියලු අලෙවි නියෝජිතයින්ගෙන් බැංකු ඇපකර ලබා ගත යුතු වීම |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට Colombo Airport Super Draw ලොතරැයි අලෙවිය මත වූ ණයගැති ශේෂය රු.5,151,652 ක් විය. මෙම ලොතරැයි දිනුම් ඇදීම අවසන් වරට 2018 ජනවාරි 21 දින සිදු කර තිබුණි. මෙම ණයගැති ශේෂය 2022 අප්‍රේල් 30 දින වන විටත් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණු අතර එම සම්පූර්ණ | කොළඹ ගුවන්තොටුපළ සුපිරි ලොතරැයියෙහි රු.5,151,652 ක ණයගැති ශේෂයක් පවතින අතර එය Splash Advertising ආයතනයෙන් අයවිය යුතු මුදලක් වන අතර මේ පිළිබඳ වංචා හා විමර්ශන අංශයට 2018 ජුනි 22 දින පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. | අදාළ අංශ සමඟ සාකච්ඡා කර ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම සඳහාම අඩමාණ ණය වෙන් කිරීමක් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවලින් සිදු කර තිබුණි. | | |
| (ඉ) | විවිධ දිනුම්වාර සඳහා ඇණවුම් කරනු ලබන ලොතරැයි ප්‍රමාණයන් මුද්‍රණය කර නියමිත කාලය තුළ භාර දීමට අපොහොසත් වුවහොත්, අදාළ ගිවිසුම් ප්‍රකාරව මුද්‍රණ ආයතන වෙතින් දඩ මුදල් අය කළ යුතුව තිබුණි. එම දඩ මුදල එකී ආයතන වෙත සිදු කරන ඊළඟ ගෙවීමෙන් අඩු කර ගෙවිය යුතුව තිබුණි. 2020 ජනවාරි 20 දින සිට 2020 සැප්තැම්බර් 22 දින දක්වා පැවති ලොතරැයි දිනුම් ඇදීම් 13 කට අදාළව ලොතරැයි මුද්‍රණය කර භාර දීම ප්‍රමාද වීම නිසා මුද්‍රණකරුවන් වෙත එකතුව රු.1,031,759 ක දඩ මුදල් පනවා තිබුණු අතර, එම දඩ මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 ජනවාරි 20 දින සිට 2020 සැප්තැම්බර් 22 දින දක්වා පැවති මුද්‍රණය කරන ලද ටිකට්පත් ප්‍රමාද වීම සඳහා මෙගා පවර් 616, 618 හා 620 වාරයන්ට හැර අනෙකුත් දිනුම් වාරයන් සඳහා දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. මෙගා පවර් 616, 618 හා 620 වාරයන්හි මුද්‍රණ දෝෂ පැවතීම නිසා එම දිනුම් වාර සඳහා ගෙවීම් අත්හිටුවන ලද අතර, එම මුද්‍රණ දෝෂ විමර්ශනය සඳහා මුද්‍රණ දෝෂ විමර්ශන කමිටුව වෙත යොමු කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන අදාළ දඩ මුදල් සහ ප්‍රමාද වීම සඳහා දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | මණ්ඩලයේ හිටපු නිලධාරීන් විසින් නැවත භාර නොදුන් වත්කම් වෙනුවෙන් රු.275,908 ක ශේෂයක් අයකර ගත යුතුව තිබුණි. එමෙන්ම භාවිතයෙන් ඉවත් කළ ද්‍රව්‍ය අපහරණයන් මත අයකර ගත යුතු රු.33,127 ක් ද වශයෙන් එකතුව රු.309,035 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | මණ්ඩලයේ සේවය කළ නිලධාරීන් ඉවත් වීමේ දී ඔවුන් විසින් නැවත භාර නොදුන් වත්කම් වෙනුවෙන් හා වෙනත් දෑ සඳහා ඔවුන් විසින් මණ්ඩලයට ගෙවීමට ඉතිරි වී ඇති මුදල රු.275,908 ක් වේ. එම මුදල අය කර ගැනීමේ කටයුතු සඳහා දැනට කමිටුවක් පත් කර අදාළ කටයුතු සිදු කර ගෙන යනු ලැබේ. | ආපසු භාර නොදුන් වත්කම් වෙනුවෙන් අය විය යුතු මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (උ) | අලෙවි නියෝජිතයින් වෙත ලබාදුන් බයිසිකල්, මෝටර් බයිසිකල්, පරිගණක උපාංග සහ අලෙවි කුටි වෙනුවෙන් එකතුව රු.835,218 ක් අයකර ගැනීමට 2021 දෙසැම්බර් 31 | සමාලෝචිත වර්ෂය අවසන් වන විට අය කර ගත යුතුව තිබූ රු.724,068 ක් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අලෙවි නියෝජිතයින්ගෙන් අයවිය යුතු ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | දින වන විටත් මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | | |
| (ඌ) | මූලාා ප්‍රකාශනවල සේවක ණය යටතේ දක්වා තිබූ මියගිය, වැඩ තහනම් කළ හා සේවය හැර ගිය සේවකයන්ගෙන් අය විය යුතු උත්සව අත්තිකාරම් ලෙස එකතුව රු.2,187,952 ක් අයකර ගැනීමට 2021 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | උත්සව අත්තිකාරම රු.5,000 ක්ද, ආපදා ණය රු.645,130 ක්ද හා නිවාස ණය රු.1,521,196 ක්ද අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු සිදු වෙමින් පවතී. රු.1,696 ක් වූ ආපදා ණය ශේෂය කපා හැරීමට කටයුතු කරන අතර, ඉතිරි ණය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (එ) | 2021 දෙසැම්බර් 31 දින වන විට ත්‍යාග සංචිත අරමුදලේ ශේෂය රු.2,411,724,762 ක් වූ අතර, ඒ තුළ පවත්නා ජනාභිශේකය, මනුසත් මෙහෙවර, රන් කිරුළ හා රජ දිනුම යන ලොතරැයි දිනුම් වාර පවත්වා වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණි. ජනාභිශේකය ලොතරැයි සංචිත අරමුදලේ අවාසිදායක ශේෂය වූ රු.6,759,950 ක් හා මනුසත් මෙහෙවර, රන් කිරුළ හා රජ දිනුම යන ලොතරැයි සංචිත අරමුදල්වල වාසිදායක ශේෂ එකතුව රු.15,166,256 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | රජ දිනුම, රන් කිරුළ යන ලොතරැයිවල සංචිත අරමුදලේ පවතින ශේෂය මත වූ රු.14,929,592 ක මුදලින් රු.5,016,076 ක් 2022 ජුනි මාසය අවසන් වන විට අදාළ ගිණුම වෙත මාරු කරනු ලබන අතර ඉතිරි වන මුදල වන රු.9,913,516 ක ශේෂය 2022 අගෝස්තු මාසය අවසන් වන විට අදාළ ගිණුම් වෙත මාරු කිරීම සඳහා කටයුතු කරනු ඇත. එලෙසම මනුසත් මෙහෙවර සහ ජනාභිශේක යන ලොතරැයිපත් සඳහා අදාළ සංචිත අරමුදලේ ශේෂයන් 2022 අගෝස්තු මාසය අවසන් වන විට අදාළ ගිණුම් වෙත මාරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරනු ඇත. | අදාළ ගිණුම් නිරවුල් කිරිමේ කටයුතු කඩිනමින් කළ යුතු වීම. |
| (ඒ) | 2021 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතු ත්‍යාග ශේෂය ලෙස රු.1,070,847,638 ක් මූලාා ප්‍රකාශන තුළ ඇතුළත් කර තිබූ අතර, ඒ තුළ පවර් ලොටෝ, රජ දිනුම, රන් කිරුළ සහ මහජන සම්පත ජනාභිශේකය ලොතරැයි වෙනුවෙන් වූ ත්‍යාග වටිනාකම්වල එකතුව රු.15,799,882 ක් වී තිබුණි. | මහජන සම්පත ජනාභිශේක ත්‍යාග ගෙවීම් ගිණුමෙහි පවත්නා රු.15,517,440 ක ශේෂයෙන් රු.3,775,950 ක් 2022 මාර්තු 22 දින හිමිකම් නොපෑ ත්‍යාග ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවීම් සිදු කර ඇත. ඉතිරි ශේෂය එම මුදල් පොත් නිරවුල් කර අදාළ ගිණුම් වෙත මාරු කිරීමෙහි කටයුතු මේ වන | කල් ඉකුත් වූ ශේෂ මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට හා ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අදාළ ලොතරැයි දිනුම් වාර පවත්වා මාස 06 ක කාලය ඉක්මවා තිබුණත්, මෙම වටිනාකම් සම්බන්ධයෙන් අදාළ ත්‍යාග වටිනාකම් ජයග්‍රාහකයන් වෙත ගෙවීමට හෝ හිමිකම් නොපෑ ත්‍යාග ලෙස හඳුනා ගැනීම සිදු නොකර 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ත්‍යාග යටතේ දක්වා තිබුණි. | විට සිදු කරමින් පවතී. පවර් ලොටෝ, රජ දිනුම සහ රන් කිරුළ යන මුදල් පොත් ද නිරවුල් කිරීමෙන් අනතුරුව අදාළ ගිණුම් වෙත මාරු කිරීමෙහි කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | |
| (ඔ) | දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් වෙත අලෙවි කුටි ලබා දීම වෙනුවෙන් 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ එකතුව රු.1,380,400 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම පුද්ගලයින්ගෙන් අයකර ගෙන තිබුණි. අදාළ පාර්ශවයන් වෙත අලෙවි කුටි ලබා දීම හෝ ලබාගත් මුදල් නිරවුල් කිරීම හෝ සිදු නොකර එම ශේෂය තවදුරටත් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | අලෙවි කුටි ලබා ගැනීම සඳහා මුදල් තැන්පත් කළ අලෙවි නියෝජිතයින් 101 දෙනෙකු වෙත මණ්ඩලය මඟින් අලෙවි කුටි ලබා දීම සඳහා රු.1,380,400 ක ශේෂය පවතින අතර, මෙම වර්ෂයේ දී ලබා දීමට සැලසුම් කර ඇති අලෙවි කුටි වෙනුවෙන් මෙම මුදල් හිලව් කර ගැනීමට කටයුතු කර අදාළ ගැලපීම් සිදු කර ගිණුම් ශේෂයන් පියවීමට කටයුතු කරනු ලැබේ. | අදාළ මුදල් හිලව් කිරීමේ ක්‍රියාවලින් කඩිනමින් කළ යුතු වීම. |
| (ඕ) | අලෙවි නියෝජිතයින් විසින් ජයග්‍රාහී ලොතරැයිපත් ස්කෑන් කිරීම වෙනුවෙන් එක් ලොතරැයිපතක් වෙනුවෙන් රු.0.075 ක් මණ්ඩලය විසින් අදාළ අලෙවි නියෝජිතයින් වෙත ගෙවනු ලබයි. මෙසේ ජයග්‍රාහී ලොතරැයිපත් ස්කෑන් කිරීම වෙනුවෙන් 2020 වර්ෂයේ සිට අලෙවි නියෝජිතයින් වෙත ගෙවිය යුතු එකතුව රු.5,380,221 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමකින් තොරව වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ දක්වා තිබුණි. | දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන්ගෙන් මණ්ඩලය වෙත අයවීමට තිබු ණය මුදල් වෙනුවෙන් ඔවුන්ට ගෙවීමට ඇති ලොතරැයිපත් ස්කෑන් ගාස්තු රඳවාගෙන ඇති අතර පසුව දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් විසින් අදාළ ලොතරැයිපත් සඳහා ණය පියවීමෙන් පසු මෙම රඳවා ගන්නා ලද ස්කෑන් ගාස්තු ගෙවීමට කටයුතු කරනු ලබයි. | ගෙවිය යුතු හා අය විය යුතු වටිනාකම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ක) | නව අලෙවි නියෝජිතයන් ලියාපදිංචි කිරීමේ දී මණ්ඩලය විසින් අය කරනු ලබන | මෙම ශේෂය තවදුරටත් අය කර ගැනීමේ හැකියාවක් නොමැති බැවින් අධ්‍යක්ෂ | ශේෂය කපා හැරීම සඳහා කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ලියාපදිංචි ගාස්තු ලෙස රු.988,500 ක් අයකර ගැනීමෙන් තොරව වර්ෂ 13 කට අධික කාලයක සිට ලැබිය යුතු ශේෂයක් වශයෙන් දක්වා තිබුණි. | මණ්ඩලය විසින් මෙම ශේෂය කපා හැරීමට 2022 මාර්තු 14 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අවසර ලබා දුන් අතර එම ශේෂ 2022 ජුනි මාසයේ දී මාසික ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ග) | 2017 ජූලි 18 දින අමාත්‍ය මණ්ඩලය විසින් මණ්ඩලය දැනට පවත්වා ගෙන යන ව්‍යාපාරික පරිශ්‍රය 2020 සැප්තැම්බර් මාසයෙන් අවසන් වන පරිදි වර්ෂ 02 ක කාලයකට කුලියට ගැනීම අනුමත කර තිබුණි. එම බදු කාලය අවසන් වීමෙන් පසු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත 2022 මාර්තු මාසය වන විටත් එම ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගෙන 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.117,782,484 ක බදු කුලී ගෙවා තිබුණි. | වර්තමානයේ ජාතික ලොතරැයි මණ්ඩලය පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ බදු කාලය 2020 සැප්තැම්බර් 01 දිනෙන් අවසන්වීමට තිබූ බැවින් ඊට මාස 03 කට ප්‍රථම නව ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදනය ආරම්භ කළත් රට තුළ උද්ගතවූ කොවිඩ් වසංගත තත්ත්වයන් යටතේ එම ප්‍රසම්පාදනය අවසන් වූයේ 2021 මාර්තු 03 දිනය. එහෙත් අනපේක්ෂිත ලෙස උක්ත ප්‍රසම්පාදනයෙන් සුදුසු ගොඩනැගිල්ලක් තෝරා ගැනීමට නොහැකිවීම හා රට තුළ ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ප්‍රසම්පාදනය අනපේක්ෂිත ලෙස කල් යාම මත මෙම ගොඩනැගිල්ලේ බදු කාලසීමාව කෙටි කාලයට දීර්ඝ කිරීමට ප්‍රායෝගික තත්ත්වයන් යටතේ සිදු විය. මෙලෙස කෙටි කාල පරාසයන් තුළ බදු ගිවිසුම දීර්ඝ කිරීමේ දී අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගැනීම සම්බන්ධයෙන් ප්‍රායෝගිකව ගැටළු මතුවිය. මෙම කිසිදු බදු කාලසීමා දිර්ඝ කිරීමක දී අමාත්‍ය මණ්ඩලයේ මුල් තීරණයට පටහැනි කිසිදු කොන්දේසියක් බදු ගිවිසුම් | අදාළ විධිමත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | සඳහා ඇතුළත් නොකරන ලද අතර ජාතික ලොතරැයි මණ්ඩලයේ යහපත උපරිම ලෙස ආරක්ෂා වන ලෙස කටයුතු කර ඇත. | |
| (ච) | මණ්ඩලය විසින් දැනට ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යනු ලබන පරිශ්‍රයට යාබදව ඉදිකිරීමට යෝජිත වර්ග අඩි 2,880 කින් යුත් ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාගැනීමට 2018 ජූලි 24 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමේ දී යෝජිත ගොඩනැගිල්ලේ ස්වභාවය පිළිබඳව දැනුවත් කිරීමක් සිදු කර නොතිබුණි. මෙම ගොඩනැගිල්ල විධිමත් අනුමැතියකින් තොර වූ අනවසර ඉදිකිරීමක් වී තිබුණු අතර, මණ්ඩලය රාජ්‍ය ආයතනයක් ලෙස එසේ නීති විරෝධී ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාගෙන 2020 මැයි මාසයේ සිට 2022 අප්‍රේල් මාසය දක්වා එකතුව රු.19,784,250 ක කුලියක් ගෙවා තිබුණි. | ගොඩනැගිල්ල ලබා ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලැබී ඇත. මෙම ගොඩනැගිල්ල අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත ලබා ගෙන ඇත. තව ද මෙම ගොඩනැගිල්ල සඳහා වර්ග අඩියකට රු.225 බැගින් ගෙවීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ද ලබා ගෙන ඇත. මේ අතර අනුමත කරන ලද ගොඩනැගිල්ල සඳහා සැලැස්ම සහ පදිංචියට සුදුසු බවට ලබා දෙන සහතිකය (COC – Certificate Of Completion) ලබා දෙන ලෙස ගොඩනැගිලි හිමිකරුව කිහිප වතාවක්ම දැනුවත් කර ඇති අතර මේ වන තෙක් ගොඩනැගිලි හිමිකරු විසින් එය ලබා දී නොමැත. | මණ්ඩලය සතු ඉඩමේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඡ) | 2016 නොවැම්බර් 29 දිනැති අංක 16/2468/719/150 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, මණ්ඩලය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීමට හා ඒ සඳහා රු.මිලියන 41 ක උපදේශාත්මක සේවා ලබා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. එම අනුමැතිය ලබා දී සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 05 කට අධික කාලයක් ගත වී තිබුණත්, ගොඩනැගිල්ල ඉදිකර නොතිබුණි. 1963 වර්ෂයේ දී ආරම්භ කරන ලද ජාතික ලොතරැයි මණ්ඩලය කුලී පදනම මත ලබාගත් | 2016 වර්ෂයේ දී මණ්ඩලයට ස්ථිර ගොඩනැගිල්ලක් රේඛීය අමාත්‍යාංශයෙන් ලබා ගත් අනුමැතිය මත ඉදි කිරීම් කාර්යය සඳහා වන පූර්ව කටයුතු අවසන් කිරීමට ප්‍රථම නැවත වතාවක් ස්ථිර ගොඩනැගිලි ඉදි කිරීම අත්හිටුවීමට රජය විසින් ගනු ලැබූ තීරණය නිසා නැවත වතාවක් ගොඩනැගිල්ල ඉදි කිරීම් කටයුතු නැවතී ඇත. | අදාළ පාර්ශවයන් සමඟ එකඟතාවයට පැමිණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ගොඩනැගිලිවල පවත්වා ගෙන යනු ලබන අතර, පසුගිය වර්ෂ 07 ක කාලය තුළ පමණක් කුලී ගොඩනැගිලි වෙනුවෙන් රු.399,471,200 ක් වැය කර තිබුණි. | | |
| (ට) | ඉකුත් වර්ෂවලදී වැඩිපුර ගෙවනලද රු.7,392,287 ක සේවක පාරිතෝෂික මුදල මණ්ඩලයට ආපසු අයකර ගන්නා ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2013 මාර්තු 21 දින නියෝග කර තිබුණද, එම මුදල අය කර ගැනීමට හෝ ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට හෝ සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. වැඩිපුර ගෙවා තිබුණු පාරිතෝෂික මුදල මණ්ඩලයට ප්‍රතිපූර්ණය කරන ලෙස අදාළ විශ්‍රාමික නිලධාරීන්ට ලිඛිතව දැන්වීම පමණක් මණ්ඩලය විසින් සිදු කර තිබුණි. | මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව 2018 ජූනි 29 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත යොමු කරන ලද පත්‍රිකාවක් ප්‍රකාරව අදාළ මුදල ගිණුම් පොත්පත්වලින් කපා හරින ලෙස තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් 2022 මාර්තු 24 දින පැවති විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා කර ඇති අතර මේ සම්බන්ධ ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | ලැබී ඇති නියෝගය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඩ) | 2021 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණු 2016/2017 හා 2017/2018 තක්සේරු වර්ෂවලට අදාළ ආදායම් බදු තක්සේරුවල වටිනාකම එකතුව රු.1,785,860,482 ක් හා ඊට අදාළව පැන වූ දඩ මුදල එකතුව රු.819,379,995 ක් වී තිබුණි. 2015/2016 හා 2016/2017 වර්ෂයන්ට අදාළ එකතු කළ අගය මත බදු තක්සේරුවල වටිනාකම එකතුව රු.53,073,024 ක් හා ඊට අදාළව පැන වූ දඩ මුදල රු.39,474,184 ක් වී තිබුණි. 2016 ජුනි මාසයට අදාළ උපයන විට ගෙවීම් බදු සඳහා වූ තක්සේරුව රු.419,483 ක් හා | මණ්ඩලය විසින් අදාළ බදු අභියාචනා නිසි පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කර ඇත. | අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කර කඩිනමින් අභියාචන විසඳා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

ඊට අදාළ දඩ මුදල, රු.255,483 ක් ද වී තිබුණි. ඒ අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිකුත් කර තිබුණු තක්සේරුවල හා පැන වූ දඩවල වටිනාකම රු.2,698,462,455 ක් වී තිබුණි. මෙම වටිනාකමින් 2016/2017 තක්සේරු වර්ෂයට අදාළ ආදායම් බදු සම්බන්ධයෙන් බදු අභියාචනා කොමිසමට හා ඉතිරි ඒවා සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත අභියාචනා ඉදිරිපත් කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම අභියාචනා සම්බන්ධයෙන් තීරණයන් ලබා දී නොතිබුණි.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුළු වියදමින් සියයට 57 ක ප්‍රමාණයක් විකුණුම්, අලෙවි සහ බෙදා හැරීම් වියදම් වන අතර, රු.1,074,102,918 ක් වූ එම වියදමින් සියයට 84 කට ආසන්න අගයක් අලෙවි හා විකුණුම් ප්‍රවර්ධන වියදම් වේ. එසේම අලෙවි හා විකුණුම් ප්‍රවර්ධන වියදම සමස්ථ වියදමින් සියයට 48 ක අගයක් ගෙන තිබුණි. කෙසේ වුවද, කතිපයාධිකාරී වෙළඳපල තත්ත්වයක් තුළ ක්‍රියාකරන මෙවැනි ආයතනයක් සඳහා මෙම ප්‍රචාරණ හා ප්‍රවර්ධන ක්‍රමවේදය ගැලපෙන ක්‍රමවේදයක් ද යන්න ගැටළු සහගත විය. | ලොතරැයි යනු අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩයක් නොවන අතර මිලදී ගැනීම සඳහා නිරන්තරයෙන් පරිභෝගිකයා පෙළඹවිය යුතුය. ඒ සඳහා ප්‍රචාරණ උපක්‍රම භාවිත කළ යුතු මය. මෙම තත්ත්වය යටතේ ලොතරැයි මණ්ඩල දෙක සඳහා තම අලෙවි ආදායමින් සියයට 10 නොඉක්මවන මුදලක් ප්‍රචාරණ කටයුතු සඳහා වැයකිරීමට රජය මගින් අවසර දී තිබුණ ද කිසිදු විටෙක අනවශ්‍ය පරිදි ප්‍රචාරණ කටයුතු සිදු නොකර අත්‍යාවශ්‍ය ප්‍රචාරණ ක්‍රමවේදයන් පමණක් ක්‍රියාත්මක කරනු ලබයි. | ලොතරැයි සඳහා පවතින වෙළඳපල තත්ත්වය අධ්‍යනය කර වාසිදායි ප්‍රචාරණ වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ආ) | ලොතරැයිපත් දිනුම් ඇදීමේ දිනයට ඉතා ආසන්න දිනවල දී ලොතරැයිපත් තොග, ගබඩාව වෙත ලැබෙන අවස්ථා | විගණනය මගින් පෙන්වා දී ඇති කාලයට අදාළව අවස්ථා ගණනාවක් දිනුම් ඇදීමට ආසන්න දිනවල තොග ඉතිරි | තොග ඇණවුම් කිරීමේ දී විකුණුම් පිළිබඳ ප්‍රමාණවත් පුරෝකථනයක් සිදු |

| | | | |
|---|---|---|---|
| | නිරීක්ෂණය වූ අතර, එසේ අවසානයට ලද ලොතරැයි පත්වලට සාපේක්ෂව, ගබඩාවේ පවතින ලොතරැයිපත් ප්‍රමාණය සියයට 60 ක සිට සියයට 158 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. මේ අනුව තොග ඇණවුම් කිරීමේ දී විකුණුම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පුරෝකථනයක් සිදු කර, එක් එක් අලෙවි නියෝජිතයන්ගේ විකුණුම් හැකියාව කාලීනව හඳුනා ගෙන, ඒ අනුව තොග ඇණවුම් සකස් කර නොතිබුණි. එසේම මණ්ඩලය විසින් සිදු කළ ඇතැම් අමතර තොග ඇණවුම්වලට අදාළ තොග ප්‍රමාණයන් සම්පූර්ණයෙන්ම ගබඩාවේ ඉතිරි වී තිබූ අවස්ථා පැවැතුණි. | වීම් පෙන්නුම් කිරීමට බලපාන ප්‍රධානතම හේතුව එම ආසන්න දිනවල කාලගුණික තත්ත්වයන් ඉතා අයහපත් වීම වේ. පාරිසරික සහ සාමාජීය සාධකයන් (කාලගුණික වෙනස් වීම, ඇඳිරිනීතිය ක්‍රියාත්මක කිරීම, රට වසා දැමීම, හර්තාල් ආදී අයහපත් තත්ත්වයන්) සමඟ ඉතා සංවේදී සම්බන්ධතාවයක් ලොතරැයිපත් අලෙවියෙහි ඇත. එම තත්ත්වයන් සලකා ඉතිරි තොග අවම වන අයුරින් ඇණවුම් ලබාදීම සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | කර එක් එක් නියෝජිතයාගේ විකුණුම් හැකියාව කාලීනව හඳුනාගෙන තොග ඇණවුම් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමේ දී 2017 වර්ෂයේ දායකත්වයේ අඩු වීමක් ද, 2018 සහ 2019 වර්ෂවල දායකත්වයේ වැඩි වීමක් ද, නැවත 2020 සහ 2021 වර්ෂවල දායකත්වයේ අඩු වීමක් වී තිබුණි. | 2020 සහ 2021 වර්ෂවලදී උද්ගත වූ කෝවිඩ් - 19 තත්ත්වය හේතුවෙන් අවස්ථා කිහිපයක දී රට වසා තැබීම, පනවන ලද ඇඳිරි නීති, සංචරණ සීමා සහ මහජන ඒකරාශි වීම් සීමා කිරීම යන හේතූන් නිසා ලොතරැයි අලෙවිය සඳහා බාධා ඇති විය. ඒ අනුව අහිමි වූ දිනුම් වාර සංඛ්‍යාව 2020 වර්ෂයේ දී 291ක් සහ 2021 වර්ෂයේ දී 428 ක් වේ. එබැවින් අලෙවි ආදායමින් සැලකිය යුතු ප්‍රතිශතයක් අහිමි වූ බව කිව හැක. ඒ අනුව අලෙවි ආදායම අඩු වීම අලෙවියෙන් ප්‍රතිශතයක් ලෙස සිදු කෙරෙන දායකත්වය අඩු වීමට හේතු වී ඇත. | ඉකුත් වර්ෂ 03 ක කාලයේ දී දායකත්වය අඩුවීමේ ප්‍රවනතාවයක් පවතින හෙයින් ඒ පිළිබඳ අවධානය යොමු කළ යුතු වීම. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් අලෙවි | 2019 අප්‍රේල් මාසයේ සිදු වූ | නිෂ්ක්‍රියව පවතින |

| | | | |
|---|---|---|---|
| | ප්‍රවර්ධන සහ ප්‍රචාරක කටයුතු සඳහා මිල දී ගෙන තිබුණු එකතුව රු.6,354,620 ක් වූ භාණ්ඩ ගබඩාවල නිෂ්ක්‍රීයව පැවතුණි. | පාස්තු ප්‍රහාරය, 2020 මාර්තු මාසයේ සිට 2022 ආරම්භය දක්වා පැතිරුනු කොරෝනා ව්‍යවසනය නිසා අපගේ ප්‍රවර්ධන වැඩසටහන්, සැලසුම් කළ විශේෂ දිනුම් වාරයන් ආදිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම ප්‍රධාන වශයෙන් හේතු වීම නිසා සැලකිය යුතු භාණ්ඩ ප්‍රමාණයක් අප සතුව භාවිත කිරීමකින් තොරව තබා ගැනීමට සිදුවිය. | ප්‍රචාරක භාණ්ඩ විධිමත් ක්‍රමවේදයක් අනුව භාවිතයට ගත යුතු වීම. |
| (ආ) | ලොතරැයි දිනුම් ඇදීම්වල දී ත්‍යාග ලෙස ලබා දීම සඳහා 2015 වර්ෂය අවසන් වන විට මිල දී ගෙන තිබුණු එකතුව රු.1,787,668 ක් වටිනා රත්තරන් කාසි සහ මාල ඇතුළු රන් භාණ්ඩ ඒකක 53 ක ප්‍රමාණයක් අදාළ කාර්යය සඳහා යොදා ගැනීමකින් තොරව බැංකු සේප්පුවල තැන්පත් කර තිබුණි. එහි වර්තමාන වටිනාකම රු.මිලියන 3.86 ක් වී තිබුණි. | මෙම රන් භාණ්ඩ මීට ප්‍රථම විශේෂ වාරයන්හි ත්‍යාග ලෙස ඇතුළත් කර, ජයග්‍රාහකයින් ඉදිරිපත් නොවීම මත දැනට ගබඩාවේ ඉතිරිව පවතී. එසේම, මෙම වර්ෂය තුළ එම භාණ්ඩයන් ද යොදා ගැනීම හේතුවෙන් තවදුරටත් ගබඩාවේ ඉතිරිව පවතින රන් භාණ්ඩවල වටිනාකම රු.942,157 කි. එම භාණ්ඩයන්ගෙන් බොහෝමයක් වර්ෂයේ ඉදිරි කාලයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති විශේෂ දිනුම් වාරයන්, විශේෂයෙන් ධන නිධානය දහස් වන වාරයේ විශේෂ දිනුම් වාරයේ අතිරේක ත්‍යාග වශයෙන් ඇතුළත් කිරීමට සැලසුම් කර ඇත. | නිෂ්ක්‍රියව පවත්නා තෑගි භාණ්ඩ විධිමත් ක්‍රමවේදයන් අනුව ලොතරැයි දිනුම් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම. |